ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක 2017 මැයි 22

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2017 අප්‍රේල්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

**දුර: 011-2147414** **ෆැක්ස්: 011-2877945** **ඊමේල්: prices@statistics.gov.lk**

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2017 අප්‍රේල් මාසයේ වාර්ෂික උද්ධමනය 8.4%ක් ලෙස ගණනය කර ඇති බව ප්‍රකාශ කලේය. 2017 මාර්තු මාසයේ උද්ධමනය 8.6%ක් විය. 2017 අප්‍රේල් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 5.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.3%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2016 අප්‍රේල් මාසයේ මිල ගණන් අවම මට්ටමක පැවතීම නිසා එම මාසයේ උද්ධමනය සඳහා මෙම එක් එක් කාණ්ඩයේ දායකත්වය 2.1%ක අඩු අගයක පැවතිනි.

කෙසේ නමුත් 2017 අප්‍රේල් මාසයේ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කළවිට 2017 මාර්තු මාසයේ දර්ශකය 119.5 සිට 2017 අප්රේල් මාසයේ දර්ශකය 121.0 දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2017 අප්‍රේල් මාසයේ මෙම වැඩිවීම 1.5ක දර්ශකාංක වැඩිවීමක් හා 1.3ක ප්‍රතිශතාංක වැඩිවීමක් ලෙස වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.23%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.04%කින් වැඩිවීම බලපා ඇත.

2017 අප්‍රේල් මාසයේ ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා එළවළු, පොල්, කෙසෙල්, අළුත් මාළු, රතුළූණු, අර්තාපල්, කුකුල් මස්, අමු මිරිස්, පොල්තෙල්, සීනි, කරවල සහ සහල් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පැපොල්, මයිසූර් පරිප්පු සහ වියළි මිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සසඳන කල 2017 අප්‍රේල් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’, ‘රෙදිපිළි හා පාවහන්’, ‘විවිධ භාණ්ඩ හා සේවා’ සහ ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. ‘ආපනශාලා හා හෝටල්’ සහ ‘ප්‍රවාහන’යන කාණ්ඩවල ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන’, ‘සෞඛ්‍ය’, ‘සන්නිවේදන’, ‘විනෝදාත්මක හා සංස්කෘතික’ සහ ‘අධ්‍යාපන’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2016** | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 |
| | ජූනි | 116.1 | 2.1 | 6.4 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |
| | ඔක්තෝම්බර් | 114.7 | 1.1 | 5.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |